# නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

**සී/ස ගාල්ල දිස්ත්‍රික් සණස සමිති සංගමයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන/ මානව සම්පත්/ පරිපාලන / සංවර්ධන) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

**කේත අංකය** : EL-02 III **ශ්‍රේණිය**

**වැටුප් පරිමාණය :** EL-02-22,000-600x5-680x5-760x10-840x10-920x12-55,440

කොමිෂන් සභාවේ 01/2022 චක්‍ර ලේඛනය අනුව අනුමත ජීවන අංක දීමනාව රු. 2,500.00 රු.7,500.00 දීමනාව, අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත රු. 5,000.00 දීමනාව, රු.1,000.00 විධායක දීමනා, ණය දිරි දීමනා, කාර්යක්ෂමතා දීමනා ගෙවනු ලැබේ.

තවද හදිසි අනතුරු රක්ෂණාවරණයක්, නිල ඇඳුම්, සේවක අර්ථසාධක අරමුදලට, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සහ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක කරනු ලැබේ.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2024.06.05 වන දින මධ්‍යහ්න 12.00 දක්වා**

**වයස් සීමාව** : අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය.

සමුපකාර සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍යය කළමනාකරණය, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 05 කට නොඅඩු පළපුරුද්ද/පුහුණුව ලබා තිබීම හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම උපාධියක් ලබා තිබීම සහ රජයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයට අදාළ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 05 කට නොඅඩු පළපුරුද්ද/පුහුණුව ලබා තිබීම හෝ EL – 03 මට්ටමේ I ශ්‍රේණියේ තනතුරක සේවය කිරීම හෝ EL – 03 මට්ටමේ II ශ්‍රේණියේ තනතුරක වසර 04 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

වෙනත් සමුපකාර සමිතියක සේවය කරන අයකු අයදුම්පත් අදාළ සමිතිය මගින් ඉදිරිපත් කළ යුතුය. සමුපකාර සමිතියක සේවය කරන අතරතුර ඍජුව අයදුම්පත් එවා ඇති බව ඔහු/ඇය තෝරාගත් පසුව වුවද අනාවරණය වුව හොත් තනතුර අහිමි වීමට එය හේතුවක් වන බව දන්වමි.

**අයදුම්පත් එවිය යුතු ක්‍රමය** : තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් සමග සුදුසුකම් සනාථ කිරීමේ සහතිකවල ඡායා පිටපත්, උප්පැන්න සහතිකයේ සහ හැඳුනුම්පතේ ඡායා පිටපත් අනිවාර්ය වේ.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය :** ගරු සභාපති, සී/ස ගාල්ල දිස්ත්‍රික් සණස සමිති සංගමය, තක්සලා, 153, අබ්දුල් වහබ් මාවත, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ පැමිණ භාර දිය හැක.

ලියුම් කවරයේ වම් පස ඉහළ **"නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන / මානව සම්පත්/ පරිපාලන/ සංවර්ධන) තනතුර සඳහා"** යනුවෙන් සඳහන් විය යුතුය.

**සැයු. මූලික සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.**